# යටහලෙන රජමහා විහාරයේ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ශ්‍රීමාලිසිරිවර්ධන[18]

---

මෙම යටහලෙන විහාරය යටාලතිස්ස කුමරු උපන් ස්ථානය බැවින් මහානාග රජතුමා කටාර කොටවා සෙල්ලිපියක් මගින් මහා සංඝයාට පුජා කර තිබේ. මෙහි තිබෙන ඉතිරි ගල්ලෙන් ද එසේ පූජා කරන ඒවා ය. යටාලතිස්ස රජුගේ ඇවැමෙන් පසු ගෝඨාභය රජු බවට පත් වු අතර ඔහු මියයෑමෙන් පසු කාවන්තිස්ස කුමරු රජ බවට පත්විය. ඔහු මෙම ස්ථානය විහාරයක් බවට පත් කර ඇත. මෙම විහාරස්ථානය පුරාවිද්‍යාත්මක වශයෙන් අධ්‍යයනය කිරිමේ දී මුලින්ම මුලාශ්‍රය අධ්‍යයනය කිරිම ගවේෂණය කිරීම සිදු කරන ලදි. මෙම විහාරස්ථානය තුළින් ක්‍රි.පු. යුගයට අයත් බ්‍රහ්මීය සෙල්ලිපි 3 ක් හමු වේ. විහාරය ඉදිරිපස උළු සෙවලි කළ ද්වාර මණ්ඩපයක් ඉදිකර ඇත. ඒ කටාරයට පහළින් බ්‍රාහ්මී ශිලා ලිපි හඳුනා ගත හැකි වුව ද අක්ෂර කියවිමට නොහැකි වන පරිදි සණ ලෙස හුණු ආලේප තවරා ඇත. ගලෙන් හා මැටිටෙන් බැඳ ඇති බිත්ති හා ඉදිරිපස බිත්ති සියවසකට පමණ ලගාවෙයි. ලෙනෙහි පසු මුහුණෙහි පිළිමයක් ද වේ. ලෙන් බිත්තියේ මැනවින් අඳින ලද සිත්තම් තිබුණ ද දැනට ඉතිරිව ඇත්තේ එක් චිත්‍රයක් පමණි. පතිත වී ඇති දැවැන්ත වටකුරු ගලක් විහාරයේ දකුණු බිත්තියත් අතර සිරවෙමින් යන්නාට පර්වත පාදය අසීරුවෙන් නැගිමෙන් දෙවැනි ගුහාවට ඇතුළු විය හැකි ය. මෙහි යට "පොත්ගුල"ඉදි කර තිබුනේ යැයි ගම්වාසීන් ප්‍රකාශ කරන අතර එම බිත්ති තවම පවති. මෙහි ඇති ශිලා ලේඛනය හොඳින් කියවිය හැකි ය. වමට හැරි ඉදිරියට යනවිට වර්තමාන විහාරය පවත්නා පර්වතයට ඉහළින් තුන්වැනි ගුහාව වේ. මෙය අතීතයේ දෙවැනි විහාරය ලෙස භාවිත කර ඇත. බිත්තියේ කොටස් කිහිපයක් ශේෂ වී පවති. මෙම පර්වතයේ කටාරයට පහළින් දීර්ඝ වු ශිලා ලේඛනයක් පවතින අතර එය මුල සිට අග දක්වා කියවිය හැකි අතර එය මුල සිට අග දක්වා කියවිය හැකි ය. කන්ද මුදුනේ පොකුණක් පවතින අතර අනෙක් පස බල්ලා කන්දේ ඉදිරියෙන් පෙනෙන පෙදෙසෙහි පොත්ගුල් ලෙන යන නිමින් හැඳින්වෙන ලෙනක් ද වේ. වර්තමානයේ යටහලෙන රජමහා විහාරය විශාල වශයෙන් පරිහානියට පත් වෙමින් පවතින අතර නිධන් හොරු මෙහි ඇති හිටි පිළිමය විනාශ කර ඇත.මෙම ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු වී නොමැත.

ප්‍රමුඛ පදඃ කටාරම, ශිලාලේඛන, ලෙන

---

[18]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, Srimalisiriwardhana91@gmail.com.